# ටෙන්ඩර් දැන්වීමයි
## අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය සභාව

අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය සභාවට අයත් පහත උපලේඛණයේ සඳහන් දේපළ 2015.01.01 දින සිට 2015.12.31 දින දක්වා කාලය සඳහා බදු එකතු කිරීමේ අයිතිය / එළදාව තෙලා ගැනීමේ අයිතිය බදු දීම වෙනුවෙන් මුද්‍රා තබන ලද ටෙන්ඩර්පත්, 2014.10.28 දින පෙ.ව. 10.30 දක්වා මා විසින් භාරගනු ලබන අතර, එදිනම පෙ.ව. 11.00 ට ටෙන්ඩර් මණ්ඩලය ඉදිරියේ ටෙන්ඩර් විවෘත කරනු ලැබේ.

01. ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතු වන්නේ ආපසු ගෙවන ලද අදාල ටෙන්ඩර් ඇප හා ආපසු ගෙවනු නොලබන ටෙන්ඩර් පෝරම ගාස්තු ගෙවීමෙන් පසු 2014.10.27 වන දින ප.ව.3.00 දක්වා මෙම කාර්යාලයෙන් ලබාගත හැකි ආකෘති පත්‍රයක් මගිනි. එමෙන්ම අදාල ගාස්තු වෙනුවෙන් මුදල් ඇණවුමක් යොමු කිරීමෙන් ද කාර්යාලය මගින් නිකුත් කරන ටෙන්ඩර් පෝරම ගෙන්වා ගත හැක.

02. ටෙන්ඩර් පෝරම ලබා ගැනීමට ප්‍රථම ටෙන්ඩර් පෝරම ලබා ගන්නාගේ අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා ජාතික හැඳුනුම්පතද, ස්ථිර පදිංචිය සනාථ කිරීම සඳහා අදාල ග්‍රාම නිලධාරිගෙන් ලබා ගත් සහතිකයක්ද අනු අත්සන් කර ඉදිරිපත් කළ යුතුය.

03. මුදල් ඇණවුමක් මගින් ටෙන්ඩර් පෝරම ගෙන්වා ගැනීමට අපේක්ෂා කරන අයදුම්කරුවන් ඉහත 02 වන කොන්දේසියේ සඳහන් ලිපි ලේඛණ වල සහතික කරන ලද පිටපත්, මුදල් ඇණවුම සමග අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය සභාව වෙත යොමු කළ යුතුය.

04. සෑම ටෙන්ඩරයක්ම පිටපත් දෙකකින් යුක්ත විය යුතුය. නිසි පරිදි සම්පූර්ණ කරන ලද ටෙන්ඩර්පත් වෙන වෙනම ලිපි කවර වල බහා (මුල් පිටපත, අනු පිටපත යනුවෙන් සඳහන් කර ) නැවත එක් ලිපි, කවරයක බහා, මුද්‍රා තබා එහි වම් පස ඉහල කෙලවරේ ටෙන්ඩර් ඉල්ලුම් කරන කාරණය සඳහන් කළ යුතුය.

05. ටෙන්ඩර්පත් වල යම් වෙනස් කිරීමක් හෝ මකා දැමීමක් ඇතොත් ටෙන්ඩර්කරු විසින් ඒවා තම කෙටි අත්සන තබා සහතික කර එවිය යුතුය.

06. ටෙන්ඩර් විවෘත කරනු ලබන අවස්ථාවට ටෙන්ඩර් ඉල්ලුම්කරුට හෝ ඔහු විසින් ලිඛිතව පවරනු ලබන නියෝජිතයෙකුට පැමිණ සිටීමට අවසරය දෙනු ලැබේ. ටෙන්ඩර් ඉදිරිපත් කර ඇති අයගේ නම් සහ එක් එක් ටෙන්ඩර්කරු විසින් සඳහන් කර ඇති මිළ ගණන් දැන ගැනීම සඳහා ප්‍රකාශයට පත් කරනු ලැබේ.

07. සියළුම ටෙන්ඩර්පත් නියමිත වේලාවට හෝ ඊට පෙර ලැබෙන සේ " සභාපති, අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය සභාව, අඟුණකොළපැලැස්ස " යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවීම හෝ අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය සභා කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහාලීමෙන් ඉදිරිපත් කළ හැකිය.

08. ප්‍රමාද වී ලැබෙන / ටෙන්ඩර් පෝරම ලබාගෙන ඉදිරිපත් නොකරන / අසම්පූර්ණ ටෙන්ඩර් හා අවම ලංසුවට අඩුවෙන් ඉදිරිපත් කරනු ලබන ටෙන්ඩර් ප්‍රතික්ෂේප කරනු ලබන අතර අයදුම්කරුවන්ගේ ඇප මුදල සභාව සතු කරනු ලැබේ.

09. ටෙන්ඩරය පිළිගත් බවට දැනුම්දී, දින 7ක් ඇතුලත ටෙන්ඩර්ගත මුදලින් 25%ක ප්‍රමාණයක් වූ මුදලක් ආරක්ෂිත ඇප වශයෙන් මෙම කාර්යාලයේ තැන්පත් කර ගිවිසුම්ගත විය යුතුය. සියළුම ගෙවීම් මුදලින් ගෙවිය යුතු අතර, ඒ සඳහා චෙක්පත් භාරගනු නොලැබේ.

10. සාර්ථක ටෙන්ඩර්කරු විසින් මෙම ලංසු මුදල් වලට අමතරව රජය විසින් කලින් කලට පනවනු ලබන බදු මුදල්ද ගෙවිය යුතුය.

11. ඉහත 08 වන කොන්දේසිය කෙසේ සඳහන් වුවද රු.1000.00 කට අඩු බදු දීම සඳහා ටෙන්ඩර් පිළිගත් බව දැනුම් දී දින 7 ක් ඇතුලත එම සම්පූර්ණ ටෙන්ඩර්ගත මුදල එකවර ගෙවා ගිවිසුම් අත්සන් කළ යුතුය.

12. සභාව පිළිගනු ලබන සාර්ථක ටෙන්ඩර්කරු සභාව නියම කරනු ලබන දිනයකදී මෙම කාර්යාලය මගින් කෙටුම්පත් කරන ලද කොන්දේසි ඇතුලත් නොතාරිස් ගිවිසුමකට හා ඇප බැඳුම්කරයකට අත්සන් කළ යුතු වන්නේය. ඒ සඳහා වන සියළුම වියදම් බදුකරු විසින් දැරිය යුතුය.

13. අඟුණකොළපැලැස්ස මහජන සති වෙළඳපොළ ටෙන්ඩරය සඳහා අඟුණකොළපැලැස්ස මහජන සති පොළ පාපැදි ගාල භූමියද ඇතුලත් වේ.

14. ගිවිසුම් ප්‍රකාරව බදු වාරික මුදල සෑම මසකම 20 වන දිනට පෙර ගෙවිය යුතුය.නියමිත දිනට වාරික මුදල් ගෙවනු නොලැබූ විට වාරික මුදලින් 0.5% (සියයට භාගයක) දඩ මුදලක් ප්‍රමාද වන එක් දිනයක් පාසා ගෙවිය යුතුය. එසේ ගෙවීම සති දෙකක් පැහැර හැරියහොත් බද්ද අවලංගු කර ආරක්ෂිත ඇප මුදල් සභාව සතු කරනු ලැබේ. එවැනි අවස්ථාවකදී නැවත බද්ද විකිණීම හෝ සභා සේවකයින් යොදවා බදු අය කිරීම හෝ සුදුසු ක්‍රියා මාර්ගයක් ගැනීමට සභාවට බලය ඇත.

15. අඟුණකොළපැලැස්ස මහජන සති වෙළඳපොළ (තොග) සෑම සතියකම අඟහරුවාදා සහ සෙනසුරාදා අළුයම 4.00 ට එළවළු පොළද පෙ.ව. 7.00 ට කෙසෙල් කැන් පොළද පැවැත්වේ. එමෙන්ම සිල්ලර පොළ සෑම සතියකම බදාදා සහ ඉරිදා දිනයන්හිදී පැවැත්වේ. සති පොළවල් සඳහා බදු අය කිරීමේදී අය කළ හැකි බද්ද ගොවි විකුණුම් මිලෙන් 5% (සියයට පහක්) වූ උපරිමය නොඉක්මවිය යුතුය.

16. මාළු වෙළඳපොළ සඳහා බදු අය කිරීමේදී අය කළ හැකි බද්ද විකුණුම් මිලෙන් 5% (සියයට පහක්) වූ උපරිමය නොඉක්මවිය යුතුය.

17. ගිවිසුම් වලට එළඹී බදුකරුවන්ට වර්ෂය අතරතුර බද්ද අතහැර දැමිය නොහැකිය.එසේ අතහැර දැමීමෙන් ඔහුගේ ඇප මුදල් සභාව සතු වන අතර, ඔහුගේ නම අසාධු ලේඛනගත කරනු ලැබේ. එසේ වුවහොත් රජය සමග කිසිදු ගිවිසුමකට එළඹීමට නුසුදුස්සෙකු වනු ඇත.

18. වැඩි විස්තර කාර්යාල වේලාව තුළදී මෙම කාර්යාලයෙන් විමසා දැනගත හැකිය.
(දුරකථන අංක - 047 2228275 / 047 4937091 )

එම්.විජේරත්න,
සභාපති,
අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය සභාව

2014.10.02 වන දින,
අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය සභා කාර්යාලයේදී ය.